// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2318/54 - 2023 පෙබරවාරි මස 10 වැනි සිකුරාදා- 2023.02.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත් සභාවේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සංශෝධිත ප්‍රඥප්ති කෙටුම්පත පහතින් සඳහන් කරමි.

**චන්දන රණවීර ආරච්චි,**
බස්නාහිර පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශ ලේකම්.

2023 පෙබරවාරි මස 10 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 204, 7වන මහලේ පිහිටි,
බස්නාහිර පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ දීය.

1A - PG 6210 — 206 (2023/02)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2023 අංක 01 දරන බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ප්‍රඥප්තිය

බස්නාහිර පළාත තුල පශු සම්පත් සංරක්ෂණය කිරීම , රැකගැනීම , වැඩිදියුණු කිරීම හා සත්ව රෝග වැළැක්වීම, සතුන්ට ප්‍රතිකාර කිරීම හා ඊට අදාල පරිපාලන කටයුතු වලට පහසුකම් සැලැස්වීම සඳහා බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම හා ඊට අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2023 අංක 01 දරන බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලද දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

## I කොටස

### බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම

පළාත් සත්ව පාලන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ධූරය හා සත්ව පාලන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම හා එහි කාර්ය මණ්ඩලය

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටුකිරීම සඳහා බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ යනුවෙන් හඳුන්වනු ලබන ධූරයක් මෙයින් ඇති කරනු ලබන අතර එම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ධූරයේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව නමින් හඳුන්වනු ලබන දෙපාර්තමේන්තුවක් මෙයින් පිහිටුවනු ලැබේ.

(1) බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේ ය.

(2) මෙහි මින්මතු "අධ්‍යක්ෂ" වශයෙන් සඳහන් කරනු ලබන බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාට බලතල ක්‍රියාත්මක කිරීම පිණිස කාර්ය මණ්ඩලයක් විය යුතු ය.

(3) ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරිවරයෙකු අධ්‍යක්ෂක ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂකගේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම පිණිස අතිරේක පළාත් අධ්‍යක්ෂවරයෙකු, විෂයානුබද්ධ විශේෂඥවරයෙකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු, ප්‍රාදේශීය පශු වෛද්‍ය නිලධාරීන් සහ සත්ව පාලන නිලධාරීන් විය යුතු ය.

(5) අධ්‍යක්ෂක විසින් තමා වෙත පැවරී ඇති කාර්යයන් හා බලතල අතිරේක පළාත් අධ්‍යක්ෂවරයෙකු, විෂයානුබද්ධ විශේෂඥවරයෙකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය පශු වෛද්‍ය නිලධාරීන් හා සත්ව පාලන නිලධාරින් යන තනතුරු වලට ලිඛිතව පවරා දිය හැකි ය.

(6) අධ්‍යක්ෂවරයාද ඇතුළුව දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පත් කිරීම, ස්ථාන මාරුකිරීම, සේවයෙන් පහකිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම හා වෙනත් අනුශංගික කරුණු සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අදාළ වන්නේ ය.

## II කොටස

### දෙපාර්තමේන්තුවේ අරමුණු , බලතල හා කාර්යයන්

දෙපාර්තමේන්තුවේ අරමුණු

3. පළාත ඇතුළත පශු සම්පත් සංරක්ෂණය කිරීම, රැකබලා ගැනීම, වැඩිදියුණු කිරීම, සියළුම සතුන්ගේ රෝග වැළැක්වීම, ප්‍රතිකාර කිරීම හා ඊට අදාල තාක්ෂණික හා පරිපාලන කටයුතු සිදු කිරීම දෙපාර්තමේන්තුවේ අරමුණු වන්නේ ය.

4. අධ්‍යක්ෂවරයා සතු බලතල පහත පරිදි විය යුතුය. අධ්‍යක්ෂකවරයා සතු බලතල

(1) පහත සඳහන් ආයතන සඳහා අදාල විය යුතු ප්‍රමිතිය නියම කිරීම හා අවශ්‍ය ඕනෑම අවස්ථාවක එම කාර්යයන්ට අදාල තොරතුරු ලබා ගැනීම හෝ පරික්ෂා කිරීම සඳහා දවසේ සාධාරණ වේලාවක පහත ආයතන වලට ඇතුළුවීම හා අවශ්‍ය ලේඛන පරික්ෂා කිරීම හා භාරයට ගැනීම.

(අ) පළාත තුල පවත්වාගෙන යන සත්ව ගොවිපළවල්;

(ආ) සත්ත්ව අභිජනනය, බෝ කිරීම, විකිණීම, විනෝදය හා ඕනෑම පරමාර්ථයක් සඳහා සතුන් ඇති කරන ස්ථාන, සතුන් ඝාතනය කරනු ලබන ඝාතක මඩු හෝ ඝාතකාගාර;

(ඇ) සත්ත්ව ආහාර නිෂ්පාදනය කරන, ගබඩා කරන, රැස්කරන, බෙදාහරින හා අලෙවිකරන ස්ථාන;

(ඈ) සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන රෝහල් සහ මධ්‍යස්ථාන;

(ඉ) පශු ඖෂධ නිෂ්පාදනය කරන , ගබඩා කරන, රැස්කරන, බෙදාහරින හා අලෙවිකරන ස්ථාන;

(ඊ) පශු නිෂ්පාදන හා ඒ ආශ්‍රිත නිෂ්පාදන නිපදවන, ගබඩා කරන, රැස්කරන, බෙදාහරින, අලෙවිකරන ස්ථාන සහ සත්ත්ව සුභසාධන හා රැඳවුම් මධ්‍යස්ථාන.

(2) සතුන් අතර බෝවන හා සතුන්ගෙන් මිනිසාට බෝවන රෝග වැළැක්වීම සඳහා අවශ්‍ය රෝග වැළැක්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වසංගත රෝග වැළැක්වීම සඳහා නියැදි ලබා ගැනීම හා පරික්ෂණ අනුව නියමයන් කිරීම.

(3) පළාත තුල, පළාතෙන් පිටතට සහ පළාත තුලට සතුන්, පශු නිෂ්පාදන, පශු ඖෂධ, පශු ජෛවී නිෂ්පාදන ගෙනයාම සහ ගෙනඒම පාලනය කිරීම සහ ඒ සම්බන්ධ අනුෂාංගිකවන කාරණා ඉටු කිරීම.

(4) පළාතේ වසංගත රෝගයක් පැතිරී යන අවස්ථාවක පළාත තුල සතුන් ගෙනයාම,පළාත තුලට සතුන් ගෙන ඒම, පළාතින් පිටතට සතුන් ගෙන යාම පාලනය කිරීම.

(5) සතුන් අතර යම් වසංගත රෝගයක් පැතිරීයන අවස්ථාවක ආසාධිත ප්‍රදේශයක් ලෙස *ගැසට් නිවේදනයක්* ප්‍රකාශයට පත් කිරීම.

(6) පළාත තුල පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල පහත සඳහන් ආයතන ලියාපදිංචි කිරීම සහ නියාමනය කිරීම.

(අ) පළාත තුල පවත්වාගන යන සත්ව ගොවිපළවල්;

(ආ) සත්ත්ව අභිජනනය, බෝ කිරීම, විකිණීම, විනෝදය හා ඕනෑම පරමාර්ථයක් සඳහා සතුන් ඇති කරන ස්ථාන, සතුන් ඝාතනය කරනු ලබන ඝාතක මඩු හෝ ඝාතකාගාර;

(ඇ) සත්ත්ව ආහාර නිෂ්පාදනය කරන, ගබඩා කරන, රැස්කරන, බෙදාහරින හා අලෙවිකරන ස්ථාන;

(ඈ) සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන රෝහල් සහ මධ්‍යස්ථාන;

(ඉ) පශු ඖෂධ නිෂ්පාදනය කරන, ගබඩා කරන, රැස්කරන, බෙදාහරින හා අලෙවිකරන ස්ථාන;

(ඊ) පශු නිෂ්පාදන හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, නිපදවන, ගබඩා කරන, රැස්කරන, බෙදාහරින, අලෙවිකරන ස්ථාන සත්ව සුභසාධන හා රැඳවුම් මධ්‍යස්ථාන.

(7) දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු නියම කිරීම හා අය කිරීම.

(8) ප්‍රඥප්තියේ සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍යවන ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාල පිහිටුවීම.

(9) මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කළ යුතු බලපත්‍ර නිකුත් කිරීම.

(10) ප්‍රඥප්තිය යටතට ගැනිය හැකි වැරදි සම්බන්ධයෙන් චෝදනා ගොනු කිරීම.

(11) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් අරමුණ යටතට ගැනිය හැකි කවර හෝ කරුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සියලු බලතල

කාර්යයන්

5. දෙපාර්තමේන්තුවේ කාර්යයන් පළාත තුළ ක්‍රියාත්මක කිරීම පහත ආකාරයට වන්නේය.

(1) සතුන්ගේ ආරය උසස් කිරීම, බෝ කිරීමට අවශ්‍ය පහසුකම් හා තාක්ෂණය ලබාදීම.

(2) සියළුම සතුන්ගේ රෝග වැළැක්වීම, ප්‍රතිකාර කිරීම, රෝග විමර්ශනය කිරීම හා එම කටයුතු නියාමනය කිරීම.

(3) පශු සම්පත් හා පශු නිෂ්පාදන නිපදවීම, රැස්කිරීම, සංරක්ෂණය, ප්‍රවාහනය, බෙදාහැරීම, විකිණීමට අවශ්‍ය පහසුකම් හා තාක්ෂණික සේවා සැපයීම.

(4) පළාත තුල පවත්වාගෙන යන සත්ත්ව ගොවිපල කළමනාකරණයට අවශ්‍ය තාක්ෂණික සේවාවන් හා පහසුකම් සැපයීම.

(5) පශු සම්පත් කර්මාන්තයට අවශ්‍ය පෝෂණ වැඩසටහන් හදුන්වා දීම, නව සත්ත්ව ආහාර ප්‍රභේද හඳුන්වාදීම, පළාතට අවශ්‍ය තෘණ ප්‍රභේදවල රෝපණ ද්‍රව්‍ය ලබා දීම හා තෘණ බිම් පිහිටුවීම හා සංරක්ෂණය කිරීම.

(6) පශු සම්පත් ක්ෂේත්‍රය නඟා සිටුවීමට අවශ්‍ය අධ්‍යයනයන් සිදු කිරීම.

(7) යම් ආයතනයක ඉල්ලීම මත එම ආයතනයේ අවශ්‍යතාවයන් උදෙසා පශු සම්පත් සැලසුම් සකස් කිරීම, ව්‍යාපෘති යෝජනා ක්‍රම ක්‍රියාවේ යෙදවීම සහ ඊට සහය වීම.

(8) පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, පසුවිපරම් කිරීම, ඇගයීම.

(9) පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල ව්‍යාප්ති සේවා සැපයීම, දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(10) පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල පාරිසරික හා මහජන සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(11) පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල තොරතුරු මධ්‍යස්ථානයක්, දත්ත බැංකුවක්, සැලසුම් හා මෙහෙයුම් ඒකකයක් පවත්වාගෙන යාම.

(12) ප්‍රඥප්තියේ අරමුණු ඉටුකිරීමට අවශ්‍ය මානව, භෞතික, මූල්‍යමය සම්පත් කළමනාකරණය .

(13) විද්‍යාගාර හා විද්‍යාගාර සේවාවන් පවත්වාගෙන යාම.

(14) ප්‍රඥප්තියට අදාල කාර්යය හෝ කාර්යයන් ඉටු කිරීම.

(15) මෙම ප්‍රඥප්තිය යටතේ කවර හෝ වරදකට අදාලව අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීම.

අමාත්‍යවරයා විසින් නියෝග නිකුත් කල හැකි බව

6. අධ්‍යක්ෂවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් දෙපාර්තමේන්තුවට විශේෂ වු හෝ සාමාන්‍ය වු හෝ විධාන ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂවරයා විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය.

වාර්ෂික පාලන වාර්තාව

7. දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වා ගෙන යාම, අධ්‍යක්ෂවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීම, මෙම ප්‍රඥප්තියේ අරමුණු ලඟා කර ගැනීමට කරනු ලැබු කටයුතු හා යෝජනා ඇතුලත් වාර්ෂික පාලන වාර්තාවක් එක් එක්

වර්ෂය අවසන්ව මාස හයක කාලයක් ගතවීමට පූර්වයෙන් අධ්‍යක්ෂවරයා විසින් විෂයභාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

## III කොටස

## ලියාපදිංචි කිරීම හා බලපත්‍ර නිකුත් කිරීම

8. (1) පළාත තුල පහත සඳහන් කාර්යයන්හි නියුතුවන සෑම ආයතනයක්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු අතර එසේ ලියාපදිංචි වන සෑම තැනැත්තෙකුම වාර්ෂික බලපත්‍රයක් ලබා ගත යුතු ය. ලියාපදිංචි හා බලපත්‍රයක් ලබා ගැනීම

(අ) පළාත තුල පවත්වාගන යන සත්ව ගොවිපලවල්;

(ආ) සත්ත්ව අභිජනනය, බෝ කිරීම,විකිණීම, විනෝදය හා ඕනෑම පරමාර්ථයක් සඳහා සතුන් ඇති කරන ස්ථාන, සතුන් ඝාතනය කරනු ලබන ඝාතක මඩු හෝ ඝාතකාගාර;

(ඇ) සත්ත්ව ආහාර නිෂ්පාදනය කරන, ගබඩා කරන, රැස්කරන, බෙදාහරින හා අලෙවිකරන ස්ථාන;

(ඈ) සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන රෝහල් සහ මධ්‍යස්ථාන;

(ඉ) පශු ඖෂධ නිෂ්පාදනය කරන , ගබඩා කරන, රැස්කරන, බෙදාහරින හා අලෙවිකරන ස්ථාන;

(ඊ) පශු නිෂ්පාදන හා ඒ ආශ්‍රිත නිෂ්පාදන , නිපදවන, ගබඩා කරන, රැස්කරන, බෙදාහරින, අලෙවිකරන ස්ථාන හා සත්ව සුභසාධන හා රැඳවුම් මධ්‍යස්ථාන.

(2) මෙම වගන්තිය යටතේ වන ලියාපදිංචිය හා බලපත්‍රය ලබා ගැනීමට අදාල කොන්දේසි හා නියමයන් මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් පනවනු ලබන රීති මගින් නියම කරන ආකාරයට විය යුතු ය.

## IV කොටස

## වැරදි හා දණ්ඩන

9. පහත සඳහන් කවර ක්‍රියාවක් හෝ නොකර සිටිමක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ වරදකරු කිරීමෙන් පසු රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාස 06 ක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දණ්ඩන දෙකටම යටත් විය යුතුය. වැරදි හා දණ්ඩන

(1) අධ්‍යක්ෂවරයාට හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලබන නිලධාරියෙකුට ප්‍රඥප්තිය යටතේ වන බලතල ක්‍රියාත්මක කිරීමට බාධා කිරීම.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ ලබාගත යුතු බලපත්‍රයක් ලබා නොගෙන අදාල ආයතනය පවත්වාගෙන යාම.

(3) පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි පශු වෛද්‍ය වරයෙකු නොමැතිව සත්ව සායන, පශු රෝහල් සහ සතුන්ට ප්‍රතිකාර කරනු ලබන ස්ථාන පවත්වාගෙන යාම .

(4) පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචිය හෝ අවසරයකින් තොරව සතුන්ට ප්‍රතිකාර කිරීම, ශල්‍ය කර්ම කිරීම.

(5) පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි පශු වෛද්‍යවරයෙකුගේ ලිඛිත නියෝගයකින් තොරව පශු ඖෂධ , එන්නත් නිකුත් කිරීම, අලෙවි කිරීම.

(6) පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි පශු වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණයකින් තොරව ආහාර සඳහා ඇති කරන සතුන්ට ප්‍රතිජීවක ඖෂධ ලබා දීම.

(7) ප්‍රඥප්තිය යටතේ කාර්යයන් ඉටු කිරීමට අදාල තොරතුරු ඉල්ලා සිටින අවස්ථාවක එම තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම, සාවද්‍ය තොරතුරු සැපයීම.

(8) වසංගත රෝගයක් පැතිරී යන අවස්ථාවක ආසාධිත ප්‍රදේශයක් ලෙසට ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක එම ප්‍රදේශයෙන් පිටතට, එම ප්‍රදේශය තුලට සතුන් , පශු නිෂ්පාදන ඇතුළු තහනම් කර ඇති ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම.

(9). මෙම ප්‍රඥප්තිය යටතේ පනවන රිති උල්ලංඝනය කිරිම.

සමාප්ති ආඥාවක් ලබා ගෙන ව්‍යාපාරය අවසන් කිරිම

10. මෙම ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයකින් තොරව පරිශ්‍රයක් පවත්වා ගෙන යාමේ වරදකට වැරදිකරු වන සෑම තැනැත්තෙකුටම එසේ වැරදිකරුවීමෙන් පසු සාධාරණ කාල සීමාවක් තුල අධ්‍යක්ෂකවරයා වෙතින් බලපත්‍රයක් ලබා ගත යුතුය. එසේ බලපත්‍රයක් ලබා නොගෙන තවදුරටත් ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ නම් අධ්‍යක්ෂකවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් ඒ බව මහේස්ත්‍රාත් අධිකරණය වෙත වාර්තා කල යුතුවේ. එවිට මහේස්ත්‍රාත් අධිකරණය විසින් අදාල ව්‍යාපාරය පවත්වාගෙන යාම අධ්‍යක්ෂවරයා වෙතින් බලපත්‍රයක් ලබා ගන්නා තෙක් සමාප්ති ආඥාවක් මගින් වසා දැමීම නීත්‍යානුකූල වන්නේය.

## V කොටස

### පොදු කරුණු

රිති

11. (1) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් කරුණු සම්බන්ධයෙන් හා ප්‍රඥප්තිය යටතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට, බලාත්මක කිරීමට, බලපත්‍රයක් නිකුත් කිරීමට අදාලව ඊට අදාල කාර්යය පටිපාටි නියම කිරීම සඳහා, මෙම ප්‍රඥප්තිය යටතේ වන ලියාපදිංචියට අදාල කරුණු නියම කිරීමද ඇතුලත්ව ප්‍රඥප්තිය යටතට ගැනිය හැකි කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් පැවරෙන බලතලවලට හානියක් නොමැතිව එම කරුණු සම්බන්ධයෙන් රිති සෑදීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය.

(2) මෙම වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින හෝ ඒ රීතියේ සඳහන් යම් දිනක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රීතියක්ම, එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

එසේ පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබුවහොත් ඒ බවද ගැසට් පත්‍රයක පළ කළ යුතු අතර එම රීතිය එසේ අනුමත නොකිරීමට ගත් තීරණයේ දින පටන් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද යම් කිසිවකට ඉන් හානියක් නොවිය යුතුය.

දෙපාර්තමේන්තු කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන

12. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටු කර ගැනිමට පුද්ගලයින් හෝ ආයතන පිරිනමන මූර්ත ආධාර අධ්‍යක්ෂවරයාට භාර ගත හැකි අතර මූල්‍යාධාර පළාත් පොදු අරමුදලට බැර කළ යුතුය.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ නිලධාරීන් වශයෙන් සැලකිය යුතු බව

13. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථ නිරූපනය සහ කාර්යයන් උදෙසා දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සහ සේවකයින් රාජ්‍ය සේවකයින් වශයෙන් සලකනු ලැබිය යුතු අතර අල්ලස් පනතේ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතුය.

14. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරන යම් රාජ්‍ය නිළධාරියෙකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද හෝ යම් කාර්යයන් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු අධිකරණ ක්‍රියාමාර්ගයක් නොවිය යුතුය

15. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස — අර්ථ නිරූපණය

" පළාත" යන්නෙන් බස්නාහිර පළාතද ,

" පළාත් සභාව "යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාව ද,

" අමාත්‍යවරයා" යන්නෙන් බස්නාහිර පළාතේ අමාත්‍ය මණ්ඩලයේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂයභාර අමාත්‍යවරයාද ,

" ප්‍රධාන ලේකම් " යන්නෙන් බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්වරයා ද , අදහස් වන්නේ ය.

16. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය. — අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

EOG 02 - 0117